# සිරි දළදා වන්දනාවට පිළිවෙතින් පෙළගැසෙමු

## උභයාර්ථ සාධනයෙහි අධිෂ්ඨානශීලී වන්න

**මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ මහා නායක**

**අතිපූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහා නාහිමි**



සුවාසු දහසක් ධර්මස්ඛන්ධයේ ස්පර්ශයෙන් පරම පවිත්‍ර වූ වාම ශ්‍රී දළදා වහන්සේගේ ලක්දිවට වැඩම කරවීම ආගමික වශයෙන් පමණක් නොව සංස්කෘතික, දේශපාලනික හා සාමාජීය වශයෙන් ද ප්‍රබෝධයක් ඇති කළ ඓතිහාසික සංසිද්ධියකි.

විවිධ රාෂ්ට්‍රීය බිඳවැටීම් මධ්‍යයේ ගරුතර මහා සංඝරත්නය මෙන් ම රාජ රාජ මහාමාත්‍යාදීන් විසින් ජීවිත පරිත්‍යාගයෙන් ශ්‍රී දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීමට කටයුතු කර ඇත.

විවිධ ස්වභාවික උපද්‍රව අවස්ථාවන්හි ශ්‍රී දළදා වහන්සේ වන්දනාවට පාත්‍රකොට රටට සෙත ශාන්තිය ලබාගත් ආකාරය මෙන් ම සමස්ත මහජනතාව කෙරෙහි රත්නත්‍රයේ ආශීර්වාදය ලබා දීමට කටයුතු කළ ආකාරය ලාංකේය ඉතිහාසය තුළ මහත් උත්කර්ෂයෙන් වර්ණනා කර ඇත.

පුද්ගල ආධ්‍යාත්මික ගුණවගාවෙහි ලා ප්‍රෝත්සාහී කරවන එම සුවිශේෂී අවස්ථාව සමාජ ආධ්‍යාත්මික සංවර්ධනයෙහි ලා ද සිදු කරන බලපෑම අතිමහත් ය.

පිළිවෙතින් සරුව බුද්ධාලම්භන ප්‍රීතිය උපදවා ගෙන ජීවමාන බුදුරජාණන් වහන්සේ හා සමාන ශ්‍රී දළදා වහන්සේ දැක වන්දනාමාන කර ගනිමින් උභයාර්ථ සාධනයෙහි ලා කටයුතු සම්පාදනය කර ගැනීමට අධිෂ්ඨාන කර ගන්නා ලෙස සමස්ත මහජනතාව වෙත සිහිපත් කරමින් ලෝකවාසී බෞද්ධ මහජනතාවටත් දළදා සමිඳුන්ගේ ආශීර්වාදය සැලසේවා'යි ආශිංසනය කරම්හ.

## අති පූජනීය අවස්ථාවට සැදැහැ සිතින් එක්වෙමු

**මහා විහාරවංශික ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශ්වයේ මහා නායක**

**ආචාර්ය අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහා නාහිමි**



අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ අති පූජනීය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ සුදුසු කල බලා සකල ලෝකවාසීන්ට සියැසින් දැක බලා ගෙන වන්දනාමාන කර ගැනීමට අවස්ථාව සැලසීම අපේ පැරැණි රජ දවස සිට පැවත ආ චාරිත්‍රයකි.

ක්‍රි.ව.1592 -1604 දක්වා සෙංකඩගල පුරවරයට වඩම්මවා අලංකාර වූ මාළිගාවක් තනවා දළදා වහන්සේ එතුළ තැන්පත් කළ බව ඉතිහාසයේ සඳහන් වේ.

පෘතුගීසි ආක්‍රමණයෙන් පසු දෙවැනි විමලධර්මසූරිය රජතුමා විසින් අලංකෘත වූ තෙමහල් දළදා මන්දිරයක් කරවූ බවත්, කල්යත් ව දිරාපත් ව තිබූ දළදා මැඳුර ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසින් නැවත ප්‍රතිසංස්කරණය කළ බවත් ඉතිහාසය තුළින් කියැවේ. ඉන් පසු රාජ්‍යත්වයට පත් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමන් විසින් වර්තමානයේ දක්නට ලැබෙන අලංකාර ගොඩනැඟිල්ල කරවූ බවත්, ක්‍රිස්තු වර්ෂ 1798 - 1815 දක්වා රජ කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා විසින් පත්තිරිප්පුව ඉදිකළ බවත් තවදුරටත් සනාථ වේ.

ශ්‍රී දළදා වහන්සේ ජීවමාන බුදුරජාණන් වහන්සේ ලෙස සලකන අපේ බෞද්ධ ජනතාවට වසර 16ක් වැනි දීර්ඝ කාලයකට පසුව වුව ද වන්දනාවට අවස්ථාවක් ලැබීම පිළිබඳ අප සැම සතුටු විය යුතු ය. මෙම මහඟු අවස්ථාව ඉතා දුර්ලභ පූජනීය අවස්ථාවක් ලෙස සලකා සිව් දෙසින් පැමිණෙන ජනතාවට සැදැහැ සිතින් වන්දනාමාන කර ගැනීමට ලැබේවා'යි. ආශිංසනය කරම්හ.

## සහජීවනයෙන් ජීවත් වීමට ආශීර්වාද ලැබේවා



**ලංකා සභාව (ඇන්ග්ලිකන්) කුරුණෑගල දියෝකීසිය**

**නිශාන්ත ප්‍රනාන්දු රදගුරු හිමි**

බෞද්ධ ජනතාවට පමණක් නොව ලෝකවාසි සියලු ම ජනතාවගේ භක්ත්‍යාදරයට පාත්‍ර වූ උතුම් සිරි දළදා වහන්සේ වැඳ පුදා ගැනීමට, වසර 16කට පසු අප රටේ ජනතාවට ලැබුණ මෙම අනගි අවස්ථාව පිළිබඳ ව අපි සතුටට පත්වෙමු.

මෙ මඟින් බෞද්ධ ප්‍රබෝධය පමණක් නොව, අනෙකුත් ආගමික, ජාතික හා සංස්කෘතික ප්‍රබෝධයක් අප රටට ඇති කිරීමට ද මෙය ඉවහල් වනු ඇතැයි අපගේ විශ්වාසයයි.

අතීතයේ සිට ම රජවරු පවා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ දිවි හිමියෙන් ආරක්ෂා කළ බව ඉතිහාසය අපට පෙන්වා දෙයි. එයින් පෙනී යන්නේ අපි කුමන ආගමකට හෝ ජාතියකට හෝ අයත් වුවත්, අප රටේ සියලු ජනතාවගේ ගෞරවයටත්, ශ්‍රද්ධාවටත්, භක්තියටත් ශ්‍රී දළදා වහන්සේ පාත්‍ර විය යුතු බවයි.

අප ශ්‍රී ලංකාව බෞද්ධ රටක් වුවත්, බහු ආගමිකයන් හා ජාතීන්ගෙන් සමන්විත සංස්කෘතියන් තුළ ජීවත් වන ජනතාවකි. එබැවින් මෙම ශ්‍රී දළදා වන්දනාව මඟින් අප රටේ ජනතාවගේ ආර්ථිකය යහපත් වී, ස්වභාවික විපත්වලින් ආරක්ෂා වෙමින්, මානව අයිතීන් සුරක්ෂිත වන දේශයක් ලෙස සෞභාග්‍යය හා සමෘද්ධිය ඇති වී, එකම ශ්‍රී ලාංකික පවුලක් ලෙස සහජීවනයෙන් ජීවත් වීමට ආශීර්වාද ලැබේවා'යි මම පතමි.

## මානව ගුණදම් ඉස්මතු කරන පුණ්‍යමය අවස්ථාවක්

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති**

**අනුර කුමාර දිසානායක**



බෞද්ධයාගේ මුදුන්මල්කඩ ලෙස සැලකෙන ශ්‍රී දන්ත ධාතූන් වහන්සේට සකල ලාංකේය ජනයා ම දක්වන්නේ ඉමහත් ගෞරවයකි. ශ්‍රී ලාංකේය සංස්කෘතිය පෝෂණය කළ පූජනීය වස්තුවක් ලෙස ද දන්ත ධාතූන් වහන්සේට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි.

වසර 16කට තරම් කාලයකට පසුව අති පූජනීය මහානායක ස්වාමීන් වහන්සේගේ ආශිර්වාදය සහිත ව සිරි දළදා වන්දනාව සිදුකිරීමට ලැබීම ම මහත් භාග්‍යයක් කොට සලකමි. ශ්‍රී ලාංකේය ජාතියක් ලෙසට එකට අත්වැල් බැඳගෙන එක මවකගේ දරුවන් මෙන් තම මවුබිමේ උන්නතිය උදෙසා අඩියක් පෙරට තබා ඇති මේ මොහොතේ සිරි දළදා වන්දනාව එම ගමන් මඟට ආශිර්වාදයක් වනු ඇත. ආගමික ශ්‍රද්ධාවෙන් මෙන්ම ජාතික හැඟීමෙන් මෙරට ජනී ජනයා එකට එක් කරන මෙම දළදා වන්දනාව සියලු දෙනාගේ ම සිත් තුළ කරුණාව, දයාව, මානව ප්‍රේමය, අන්‍යෝන්‍ය සහයෝගය වැනි ගුණාංග යළි ඉස්මතු කරන්නට සමත් වනු ඇතැයි තරයේ විශ්වාස කරමි.

## දළදා හිමි අනුහසින් සෞභාග්‍යවත් කලක් උදාවේවා

**බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය**

**මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි**



බුදුරජාණන් වහන්සේගේ පිරිනිවීමෙන් පසු ව දිවමන් බුදුහිමි යැයි සලකා අප විසින් වඳින පුදනු ලබන දන්ත ධාතූන් වහන්සේ සියැසින් දැක ගැනීමට අන් කිසිදු පින්කමක දී ඉඩක් නො ලැබේ. එසේ ලැබෙන්නේ දළදා වන්දනාවක දී ම පමණි.

බුදුරජාණන් වහන්සේ විසින් දේශිත සුවාසූ දහසක් ධර්මස්කන්ධය ස්පර්ශ කළා වූ වාම දන්ත ධාතූන් වහන්සේ වනාහී සම්බුද්ධ ශාසනයේ පැවැත්ම හඟවන ශ්‍රේෂ්ඨතම සංඥවක් වැන්න.

කල් වැසි වැස, රට සෞභාග්‍යවත් ව, අනතුරු මඟහැර, ආරක්ෂා සහිත ව, සමගිය හා සමාදානය පැතිරී පවතීවා ය යන ප්‍රාර්ථනයෙන් සිදුවන මෙවර දළදා ප්‍රදර්ශනයට ද ලක්ෂ සංඛ්‍යාත පිරිසක් සම්බන්ධ වනු ඇත. එම සියලු දෙනාට දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා ගැනීමට වාසනාව උදාවේවා'යි ප්‍රාර්ථනා කරමි.